Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කෙටි සටහන් සංග්‍රහය

## දහම් පාසල් පෙළ පොත ආශ්‍රිතව

## 05 ශ්‍රේණිය



**සිරිපැරකුම්බා දහම් පාසල - ලුණුගම**

**ඩබ්.ඒ.එන්.එම්. වික්‍රමආරච්චි**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ආදරණීය පුංචි දුවේ පුතේ
# ඔබේ දහම් නැණ වඩවාලන්නට
# පිදෙන දහම් පඬුරකි
# මේ.............

## මතු පරපුරක ආයෝජනය දහම් පාසලයි

### සිරිපැරකුම්බා දහම් පාසල - ලුණුගම

ඩබ්.ඒ.එන්.එම්. වික්‍රමආරච්චි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පෙළගැස්ම


| පාඩම | පිටු අංකය |
|---|---|
| (01) අපි දහම් පාසල් යමු | 01- 03 |
| (02) අගය නිමක් නැති රුවන් තුනක් ඇති | 04 |
| (03) සඟ ගුණ සිහි කර වදිමු | 05 |
| (04) පින්බර කුමාරයෙක් | 06 - 10 |
| (05) සිදුහත් බෝසතාණෝ බුදු බවට පත්වෙති | 10 - 12 |
| (06) සුභාෂිත වදනට හුරු වෙමු | 13 |
| (07) සිත පිරිසිදු කරගනිමු | 14 |
| (08) රහත් මෙහෙණක් වීය බේමා | 15 |
| (09) විපතේ දී දිරිමත් වෙමු | 16 |
| (10) ජලය මට ඇති ධනයයි | 17 |
| (11) පැහැර නොගනිමු අන්සතු දෙය | 18 |
| (12) නිති පන්සිල් පොහොය අටසිල් | 19 |
| (13) උපුල්වන් යැයි පතල තෙරණිය | 20 |
| (14) මෙත් සිත පතුරවමු | 21 |
| (15) අපේ කටයුතු අපිම කරමු | 22 |
| (16) සුභාෂිත වදන් | 23 |
| (17) පිරිසිදුකමින් දිවි සරසමු | 24 |
| (18) විවේකය ඵලදායී කරගනිමු | 25 - 26 |
| (19) බුදු ගුණ සිහි කරමු | 27 |
| (20) වෙසක් උත්සවය | 28 |
| (21) ධම්මපදයෙන් බිඳක් | 29 |
| (22) පස් පව් | 30 |
| (23) ශාසනික ව්‍යවහාර | 31 |
| (24) පොසොන් උත්සවය | 32 |
| (25) වන්දනා ගාථා හා වන්දනා කවි | 33 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 01 පාඩම - අපි දහම් පාසල් යමු

❖ පන්සලක ඇති විහාර අංග



වෙහෙර වහන්සේ



බෝධීන් වහන්සේ



බුදු මැදුර



ධාතු මන්දිරය



ධර්ම ශාලාව



ආවාස ගෙය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



දාන ශාලාව



දහම් පාසල් ගොඩනැගිල්ල



පුස්තකාල ගොඩනැගිල්ල



ගන්ධාර කුළුන



දේවාල ගෙය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ඉවසීම
- එකට එක්ව වැඩ කිරීම
- අන් අයට උදව් කිරීම
- කළගුණ සැලකීම
- අසරණ වූ අයට උදව් කිරීම

දහම් පාසලෙන් අපට හුරු කරන ගුණාංග

යහපත් ගුණාංග ඇති කර ගැනීමට හුරුවක් ලැබෙන්නේ

**දහම් පාසල මගින් සිදු කරනු ලබන ,**

- පෙරහැර පැවැත්වීම
- ගිලානෝපස්ථානය
- වැඩිහිටියනට සැලකීම
- පැළ සිටුවීම
- සීල සමාදානය
- ධර්ම දේශනා පැවැත්වීම ආදී කටයුතු වලිනි.



**දහම් පාසල**

ආරම්භය හා ඉතිහාසය



හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

- 1881 පෙබරවාරි 13 වැනි දින **හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා** විසින් ශ්‍රී ලංකාවේ ඉරිදා දහම් පාසල් ආරම්භ කළා.

- සංවිධානාත්මකව අරඹන ලද **ප්‍රථම දහම් පාසල ගාල්ලේ වැලිවත්තේ විජයානන්ද විහාරස්ථානයේ** දී **1895 අගෝස්තු 03** වැනි දින ආරම්භ වුණා.



ගාල්ල වැලිවත්ත විජයානන්ද විහාරස්ථානය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 02 පාඩම - අගය නිමක් නැති රුවන් තුනක් ඇති

ත්‍රිවිධ රත්නය (තෙරුවන , තුනුරුවන)

**බුද්ධ**

ලොව අන් කිසිවෙකුට සමාන කළ නොහැකි උදාර ගුණ ඇති බුදුන් වහන්සේ බුද්ධ නම් වෙයි.

**ධම්ම**

බුදුරජාණන් වහන්සේ කළ දේශනාව ධර්ම රත්නයයි.

**සංඝ**

බුදුරජාණන් වහන්සේගේ ශිෂ්‍යන් වහන්සේලා සංඝ රත්නයයි.

- සංඝයා වහන්සේලා බුද්ධ පුත්‍ර ලෙස ද හඳුන්වයි.
- සංඝයා වහන්සේ සතු උසස් ගුණාංග
  - සංවරකම
  - ප්‍රිය වචන කතා කිරීම
  - වැරදි දේ නොකිරීම
  - අන් අය සමඟ එකට එක්ව කටයුතු කිරීම
  - අනුනට පිහිට වීම
  - මිත්‍රශීලී බව
  - අනෙක් අයට යහමග කියා දීම

## ලෝවැඩසඟරාව - වීදාගම මෛත්‍රී හිමි

| | |
|---|---|
| සෙත් සිරි දෙන මහ ගුණ | මුහු දාණන් |
| සත් හට වන බව දුකට | වෙදාණන් |
| තිත් ගණඳුරු දුරලන දිනි | ඳාණන් |
| සිත් සතොසින් නමදිම් මුනි | ඳාණන් |

| | |
|---|---|
| ඇම පමණින් පැවසු මුනි දෙන | තතු |
| මෙම හැම දෙන බලවයි දැක්විය | යුතු |
| තම තම නැණ පමණින් දැන ගත | යුතු |
| මම නමදිම් සදහම් පහදා | සිතු |

| | |
|---|---|
| සිරිමත් බඹ සිරසෙහි පා | පිසිනා |
| සැරියුත් මහමුගලන් | පිළිවෙළිනා |
| පිළිවෙත් සරු මහ සඟගණ | සොබනා |
| මුදුනත් බැඳ නමදිම් බැති | පෙම්නා |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 03 පාඩම - සඟ ගුණ සිහි කර වඳිමු

| | ගුණය | අර්ථය |
|---|---|---|
| 1 | සුපටිපන්නෝ | බුදුන් වහන්සේ දේශනා කළ පරිදි සුන්දර වූ ප්‍රතිපත්තියක් ඇති |
| 2 | උජුපටිපන්නෝ | ඍජු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම (මැදුම් පිළිවෙත) |
| 3 | ඤායපටිපන්නෝ | නිවනට හේතු වන අර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම |
| 4 | සාමීචිපටිපන්නෝ | සිව්පසය පිදීමෙන් උවටැන් කිරීමට සුදුසු වීම |
| 5 | ආහුනෙය්‍යය | ඉතා දුර සිට ගෙන එන සිව්පසය වුවද පුද කිරීමට සුදුසු වීම |
| 6 | පාහුනෙය්‍යය | දුර සිට පැමිණෙන ප්‍රිය මනාප ඥාති මිත්‍රයන් උදෙසා පිළියෙල කළ දෙය වුවද පිදීමට සුදුසු වීම |
| 7 | දක්ඛිණෙය්‍යො | සැදැහැවතුන් විසින් පරලොව සැප පතා දෙන දානය පිළිගැන්වීමට සුදුසු වීම |
| 8 | අංජලිකරණී | සකල ලෝ වැසියා දොහොත් මුදුන් දී කරන නමස්කාරය පිළිගැනීමට සුදුසු |
| 9 | අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං | ලෝකයා හට උතුම් පින් කෙතක් වීම |

## ❖ අට වැදෑරුම් ආර්යයන් වහන්සේලා

- සෝවාන් මාර්ගස්ථ පුද්ගලයා
- සෝවාන් ඵලස්ථ පුද්ගලයා
- සකෘදාගාමී මාර්ගස්ථ පුද්ගලයා
- සකෘදාගාමී ඵලස්ථ පුද්ගලයා
- අනාගාමී මාර්ගස්ථ පුද්ගලයා
- අනාගාමී ඵලස්ථ පුද්ගලයා
- අරහත් මාර්ගස්ථ පුද්ගලයා
- අරහත් ඵලස්ථ පුද්ගලයා




දෙදණ , දෙවැලමිට සහ නළල බිම ගැටෙන සේ පිහිටුවා වැඳීම පසඟ පිහිටුවා වැඳීමයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 04 පාඩම - පින්බර කුමාරයෙක්

- දඹදිව කිඹුල්වත්නුවර රජකම් කළ **සුද්ධෝදන රජතුමාටත් මහාමායා දේවියටත්** පුත් කුමරකු ලැබුණා.



- "ලෝකයාට සෙතක් සලසන්නා" යන අරුතින් **සිද්ධාර්ථ** ලෙස කුමරුට නම් තැබුවා.

- සුද්ධෝදන රජුගේ ගුරුවරයා වූ **අසිත තාපසතුමා** කුමරු බැලීමට පැමිණි අවස්ථාවේ දී කුමරුට වැන්දා. මෙය දුටු සුද්ධෝදන රජතුමා ද කුමරුට වැන්දා. මෙය **සුද්ධෝදන පිය රජතුමාගේ පළමු වැදීමයි**.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- කිඹුල්වත්නුවර වප්මඟුල දා සිදුහත් කුමරු අසුන මත පලක් බැද "ආනාපානසති භාවනාව" වඩනු ලැබුවා. මෙම අවස්ථාවේ **සුද්ධෝදන පිය රජතුමා ගේ දෙවැනි වැදීම සිදු වුණා.**




- නිසි වයසට පත් කුමරු ශිල්ප ඉගෙන ගැනීම සිදු කළේ **සර්වමිත්‍ර බමුණු පඬිතුමා**ගෙනි.




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- සිදුහත් කුමරු අවාහ කර ගත්තේ රජගහනුවර දෙව්දහ නුවර **සුප්‍රබුද්ධ රජතුමා**ගේ දූ කුමරිය වූ **යශෝධරාව** යි.



- වසර 13 ක් සිදුහත් කුමරු රජ සැප වින්දා.

- උයන් සිරි නැරඹීමට ගිය අවස්ථාවන් වලදී **මහල්ලෙක් , ලෙඩෙක් , මලමිණියක් , පැවදි රුවක් යන සතර පෙර නිමිති** දුටුවා.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- මේ ගැන සිතමින් උයන් සිරි නැරඹීමට ගොස් කල්පනා කරමින් සිටි අවස්ථාවේදී සිදුහත් කුමරුට පුත් කුමරෙකු උපන් බවට මාළිගය සේවකයකු පණිවිඩයක් ගෙන ආවා.

- එය ඇසූ කුමරු **රාහුලයෙක් උපන්නා ගිහිගෙය කෙරෙහි තවත් බැඳීමක් ඇති වුණා** යැයි පැවසුවා.


- කුමරුට පණිවිඩ යැවූ දූතයාගෙන් මේ බව දැනගත් පිය රජතුමා සිය මුණුබුරුට **රාහුල** ලෙස නම් තැබුවා.

- මාළිගය බලා අපසු පිටත්වන ගමනේ දී සිදුහත් කුමරුට **කිසාගොතමිය** විසින් ගායනා කරන ලද **නිබ්බුත පද** ඇසුණා.

| | |
|---|---|
| නිබුබුතා නූන සා මාතා | මෙවන් පුතෙකු ලද මවක් |
| නිබ්බුතා නූන සෝ පිතා | මෙන් පුතෙු ලද පියෙක් |
| නිබ්බුතා නූන සා නාරී | මෙන් හිමියෙකු ලද කතක් |
| යස්සායං ඊදිසෝ පති | නිසැකින්ම නිවුණෝ වෙත් |

- සිදුහත් කුමරු මාළිගයට පැමිණ සතර පෙර නිමිති පිළිබඳ සිතමින් රාත්‍රියේ නින්දට ගිය අතර අතරමගදී අවදි වුණා.

- නාටිකාංගනාවන් තැන තැන වැටී සිටිණු දුටු කුමරුට ගිහි ගෙය පිළිබඳ කළකිරීම තවදුරටත් වැඩි වුණා.




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- චන්නට අසු සුදානම් කරන්න යැයි පවසා යශෝධරා සහ පුත් කුමරු සිටි කාමරයට එබී බලා සිත දිරිමත් කර ගත් සිදුහත් කුමරු ගිහි ගෙය අත හැර මාළිගයෙන් පිටවුණා. එය **ඇසළ** පුර පසළොස්වක පොහොය දිනයයි.

- මෙය **අභිනිෂ්ක්‍රමණයයි**.








- **අලාර කාලම , උද්දකරාම පුත්ත** යන ආචාර්යවරුන් ඇසුරු කරමින් සිදුහත් තවුසා සත්‍ය සොයා ගියා.

- තමන් වහන්සේ සොයන සත්‍ය ඔහුන් ළඟ නනාමැති බව අවබෝධ කරගත් සිදුහත් තවුසා ඔවුන්ගෙන් නික්ම තනිවම සත්‍ය සොයා යාම ඇරඹුවා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 05 පාඩම - සිදුහත් බෝසතාණෝ බුදු බවට පත් වෙති

- මගධයෙහි සැරිසරමින් රජගහනුවරට පැමිණි බෝසතාණන් වහන්සේට **බිම්බිසාර රජු** මුණ ගැසුණා.
- බිම්බිසාර රජු රාජ්‍ය පාලනයට තමා හා එක් වන ලෙසට සිදු කළ ආරාධනාව සිදුහත් තවුසන් විසින් ප්‍රතික්ෂේප කළා.
- බෝසතාණනන් වහන්සේ රජගහනුවර සේනානි ගමට වැඩම කළා.
- සිරුරට දුක් දීමෙන් සත්‍ය සෙවිය හැකි බව සිතා ආහාර ගැනීමේ වාර ගණන අඩු කළා.
- බෝසතාණන් ගේ සිරුර වැහැරී ගිය අතර එතුමන් මිය යන්නට ඇතැයි ඇතැම් දෙවි දේවතාවුන් සිතුවා.



- මේ කාලයේ **පස්වග තවුසන්** බෝසතාණන් වහන්සේට උවැටන් කරමින් සිටියා.
- වීර්ය අත්නොහළ උන්වහන්සේ **අප්‍රාණික ධානය** වැඩියා. එනම් නාසයෙන් හෝ මුඛයෙන් හුස්ම ඉහළට ගැනීම හෝ පහළ හෙළීම නතර කර දැමුවා.
- මේ කිසිවක් සත්‍ය සොයන මග නොවන බව සිදුහත් බෝසත් තුමාට වැටහුණ අතර යළිත් පිණ්ඩපාත වඩිමින් **මැදුම් පිළිවෙත** අනුගමනය කළා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- බෝසතාණන් වහන්සේ වීර්ය අත්හළ යැයි සිතා පස්වග තවුසන් බෝසතාණන් වහන්සේව අතහැර ගියා.

- සිදුහත් බෝසාතාණෝ සේසානි ගම **සුජාතා සිටු දේවි** ලබා දුන් කිරිපිඬු වැළදීමෙන් පසු **ගයාවේ ඇසතු බෝ රුක මුල වෙසක් පුර පසළෝවක පෝය** දින සම්මා සම්බුද්ධත්වයට පත් වූහ.



- එදින රාත්‍රියේ දී ,

  - පුබ්බේනිවාසානුස්සති ඥාණය - තමන් වහන්සේගේ පෙර ආත්ම පිළිබඳ දැනගන්නා නුවණ
  - චුතූපපාත ඥාණය - සත්වයින්ගේ ඉපදීම හා චුතවීම දැනගන්නා නුවණ
  - අසවක්ඛ්‍යය ඥාණය - සියළු කෙලෙස් මුලින්උපටා දැමීම නිසා පහළ වූ ඥාණය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 06 පාඩම - සුභාෂිත වදනට හුරු වෙමු.

**දේශනා කිරීමට හේතුව**

දේවදත් තෙරුන්ගේ නරක ඇසුරට යොමු වීම නිසා වැරදි අදහස් ඇති කරගත් භික්ෂූන් දෙනමක් අරඹයා බුදුරජාණන් වහන්සේ විසින් මහිලාමුඛ ජාතක කතාව දේශනා කළ සේක.

**කතාවේ එන චරිත**

- මහිලාමුඛ ඇතාව සිටියේ - දේවදත්ත තෙරුණාගේ ඇසුරට වැටී වැරදි අදහස් ඇති කර ගත් භික්ෂුවයි.
- ඇමතියාව සිටියේ - අප මහා බෝසතාණන් වහන්සේයි
- රජතුමා වී සිටියේ - ආනන්ද හමුදුරුවෝයි

# මහිලාමුඛ ජාතකය

**ජාතක කතාව මහිලාමුඛ ලෙස නම් කිරීමට හේතුව**

කතාවේ සඳහන් ප්‍රධාන චරිතය ඇතායි.

ඇතාගේ නම මහිලාමුඛයි.

එනිසා මෙම ජාතක කතාවට "මහිලාමුඛ ජාතය" යැයි කියයි.

**යහපත් වචන කතා කිරීමේ අගය පෙන්වෙන තවත් ජාතක කතා**

සත්ථි කුම්භ ජාතකය

නන්දි විශාල ජාතකය

## යහපත් වචන කතා කරන්නෙකුගේ ලක්ෂණ

- නිතර විමසා බලා කටයුතු කරයි.
- දකින්නන්ට ප්‍රිය උපදවයි.
- අන් අයගේ අදහස් වලට ගරු කරයි.
- ගැටලු වලදී කලබල නොවෙයි.
- ඉවසිලිවන්තයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 07 පාඩම - සිත පිරිසිදු කරගනිමු.

භාවනාවට පෙර සූදානම

- කලබලයෙන් තොර නිහඬ ස්ථානයක් තෝරා ගැනීම.
- පිරිසිදු ඇඳුමකින් සැරසීම.
- මල් පහන් පුදා තෙරුවන් නැමදීම.
- එකිනෙකාගේ ඇඟෙහි නොගැටෙන සේ වාඩි වීම.

භාවනා කිරීමෙන් අපට ලැබෙන දේ

- සතුටින් සිටීම.
- නීරෝගීව සිටීම.
- දකින්නන්ට ප්‍රිය වීම.
- රුව ලස්සන වීම.
- මතක තබා ශක්තිය වැඩි වීම.

# ආනාපානසති භාවනාව

**(හුස්ම ගැනීම හා හෙළීම පිළිබඳ සිහියෙන් යුතුව සිටීමයි.)**

භාවනා ඉරියව්



අර්ධ පර්යංකය



බද්ධ පර්යංකය

භාවනා පියවර

1 පියවර

සිහියෙන් යුතුව හුස්ම ගන්න.

සිහියෙන් යුතුව හුස්ම හෙළන්න.

2 පියවර

දීර්ඝව හුස්ම ගන්නා විට දීර්ඝව හුස්ම ගන්නා බව සිතන්න.

දීර්ඝව හුස්ම හෙළන විට දීර්ඝව හුස්ම හෙළන බව සිතන්න.

3 පියවර

කෙටියෙන් හුස්ම ගන්නා විට කෙටිව හුස්ම ගන්නා බව සිතන්න.

කෙටිව හුස්ම හෙළන විට කෙටිව හුස්ම හෙළන බව සිතන්න.

**සුන්නිගහස්ස ලහුනෝ යත්ථකාම නිපාතිනෝ**
**චිත්තස්ස දමථෝ සාධු චිත්තං දන්තං සුඛාවහං**

**කැමති අරමුණක ගමන් කරන සුළු වූ සිත , දමනය කිරීම යහපති. දමනය කළ සිත සැප ගෙන දෙන්නේය.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 08 පාඩම - රහත් මෙහෙණක් වීය ඛේමා

## ගිහි ජීවිතය

ඛේමා **දඹදිව සාගල නුවර** උපත ලැබුවා.

රජගහනුවර **බිම්බිසාර රජු** හා ඇය විවාහ වුණා.

ඛේමා බිසව තම රූපය ගැන **මානයෙන්** පසුවුණා.

බිම්බිසාර රජු බුදුරදුන් වැඩ සිටින **වේළුවනාරාමයට** නිතර ගියත් ඛේමා එහි ගියේ නෑ.

අනිත්‍ය පිළිබඳ දහම් දෙසන බුදුරදුන්ට ඛේමා නිතර බැන වැදුණා.

රජුට මෙය මදිකමක් වුණා. රජු කෙසේ වූ උපායකින් ඛේමා බිසව වේළුවනාරාමයට රැගෙන යාමට සිතා **වේළුවනාරාමයේ සුන්දරත්වය** ගැන ඛේමා බිසවට ඇසෙන්නට සැලැස්වූවා.

වේළුවනාරාමයේ සුන්දරත්වය නැරඹීමට ඛේමා පිටත්ව ගිය අතර එහිදී බුදුරදුන් දුටුවා.

ඛේමාගේ මානය බිඳීමට බුදුරදුන් විසින් තමන්ට පවන් සලන සුරූපී අඟනක් පෙනෙන්නට සලස්වා පසුව ඇය මහළු වී ක්ලාන්තව ඇද වැටෙන අයුරු පෙන්වූවා.

ඛේමා එයින් අනිත්‍යතාව වටාහගත්තා.




## පැවිදි ජීවිතය

බුදු සසුනේ පැවිදිව රහත් බව ලැබූ ඛේමා තෙරණිය **ශ්‍රද්ධාවන්ත භික්ෂුනීන්** අතර අගතනතුරට පත් වූවා.

### මානය

තමන් හා අනුන් සන්සන්දනය කිරීම

- **සෙය්‍යමාන** – තමා අනුන්ට වඩා උසස් යැයි සිතීම
- **හීනමාන** – තමා අනුන්ට වඩා පහත් යැයි සිතීම
- **සදිසමාන** – තමා හා අනුන් සමාන යැයි සිතීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 09 පාඩම - විපතේ දී දිරිමත් වෙමු

බුදුරදුන් ජේතවනයේ වැඩ වසන සමයක එක්තරා තරුණයෙක් පැමිණ බුදුරදුන් වෙත මහණ වී තුන්මසක් ගතවුවත් චිත්ත සමාධිය පිහිටුවා ගත නොහැකිව වීර්ය අත්හැරියා.

ඒ භික්ෂුව අරඹයා මෙම ජාතකය බුදුන් වහන්සේ විසින් දේශනා කළ සේක.

දේශනා කිරීමට හේතුව

- ගැල් නායකයාගේ සහායක -භාවනා කිරීමේ වීර්ය අත්හළ භික්ෂුව
- ගැල් නායකයා - බෝසතාණන් වහන්සේ

කතාවේ එන චරිත

# වණ්ණුපථ ජාතකය

මෙම කතාවෙන් ඉගෙන ගත හැකි නායකත්ව ලක්ෂණ

- බොරු කියමින් තම සඟයන් නොරැවටීම
- වීර්යවන්ත බව
- තැනට සුදුසු නුවණ
- පිරිසෙහි එකමුතුකම පවත්වාගෙන යාම
- විපතක දී තම සඟයන් අත් නොහැර ඔවුන් හා එක්ව කටයුතු කිරීම
- සාර්ථක වන තුරු උත්සාහය අත් නොහැරීම



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 10 පාඩම - ජලය මට ඇති ධනයයි

වියළි කාල වලදී වගා කටයුතු කර ගැනීම සඳහා ජලය රැස් කර ක්‍රමවත්ව යොදා ගැනීම සඳහා සකසන ලද සංකීර්ණ ජල පද්ධතියකි.

# කලා වැව අනුරාධපුරය



*වැව හා බැදුණු තවත් නිර්මාණ*



අවුකන පිළිමය



යොධ ඇළ (තිසා වැවට ජලය ගෙන යන ඇළ මාර්ගය)

වැව් බැම්ම සැතපුම් තුනයි තුන් කාලක් දිගයි.

බැම්මේ උස අඩි 40

වැවේ ප්‍රමාණය අක්කර හයදහස් තුන්සිය අසූවයි.

*කලා වැවේ ජලය මට ඇති එකම ධනයයි.*



**ධාතුසේන රජතුමා**

*වැවට ජලය ලැබෙන්නේ*

- වර්ෂාවෙන්
- දිය උල්පත්වලින්
- ගංගා ඇළ දොළ වලින්

**අනුරාධපුර රාජධානිය වැව් බැඳි රාජ්‍ය ලෙස හඳුන්වයි.**

**රජුගෙන් ඉටු වූ තවත් සේවාවන්**

- වෙහෙ විහාර ඉදිකිරීම
  උදා - කලාවැව වෙහෙර , දක්ඛිනගිරි වෙහෙර , මියුගුණ වෙහෙර
- ලෝවාමහ ප්‍රසාදය ප්‍රතිසංස්කරණය
- මිහිඳු පෙරහැර පැවැත්වීම

*අනුරාධපුරයේ පවතින තවත් වැව්*

| | |
|---|---|
| හුරුළු වැව | මහසෙන් රජු |
| අභය වැව | පණ්ඩුකාභය |
| මහකනදරා වැව | මහසෙන් රජු |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 11 පාඩම - පැහැර නොගනිමු අනුන් සතු දෙය

**අදින්නාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
**(අන් සතු දේ නොගනිමි)**

**පන්සිල් වල දෙවන ශික්ෂාපදය යි.**

**අන්සතු දේ පැහැර ගැනීමෙන් වැළකීම මෙන්ම අන්සතු දේ ආරක්ෂා කර දීමට ද මෙම ශික්ෂා පදයෙන් පොරොන්දු වෙයි.**

❖ සොරකම සිදු විය හැකි ආකාර
- කෙනෙකු රවටා යමක් ලබා ගැනීම.
- හොරට කිරුම් මිනුම් කිරීම.
- පරණ බඩු අලුත් බඩු යැයි රවටා දීම.
- බොරු යන්ත්‍ර මන්ත්‍රවලින් රවටා මුදල් ගැනීම.

බලයෙන්වත් කිසියම් සොර සිතකින්
සියතින්වත් දැන්වූ උපදෙසකින්
පරසන්තක දෙය ගත උපසෙදකින්
නිරයෙන් නිරයට පැමිණෙයි එතෙකින්

*බලහත්කාරකමින් හෝ යම් සොර සිතකින් තමන්ගේ අතින් හෝ තමා දෙන ලද උපදේශයකින් හෝ අනුන් සන්තක වස්තුව හොරෙන් ගතහොත් එම සොරකමේ විපාකයෙන් නිරයෙන් නිරයට පත් වන්නේය.*

ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රී හිමි

❖ සොරකම් කිරීමෙන් අපට වන හානි
- අන් අයගේ විශ්වාසය නැති කර ගනී.
- තම ගෞරවය අහිමි කර ගනී.
- නින්දා අපහාස ලබයි.
- හැම විටකම බියෙන් තැති ගැන්මෙන් ජීවත් වෙයි.
- දඬුවමට ලක් වෙයි.

## තිලමුට්ඨි ජාතකය



බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කළ අතර ඔහුට බ්‍රහමදත්ත නමින් පුත් කුමරුවකු ද සිටියා.
ශිල්ප ඉගැන්වීම සඳහා කුමරුව දිසාපාමොක් ආචාරි වෙත පිටත් කර හැරියා.

දිනක් දිසාපාමොක් ආචාරීන් තම ශිෂ්‍ය දරුවන් ද සමඟ දිය නෑමට පිටත් වුණා.

දිය නෑමට යන පාරේ එක් මහළු කාන්තාවක් තල අව්වේ දමා වියළමින් සිටියා.

පුංචි කුමරුට මෙය දුටු විට තල කෑමට ආශාවක් ඇති වුණා. කුමරු එයින් තල මිටක් ගෙන කෑවා.

මහළු කාන්තාව මෙය දුටවත් "පුංචි ළමයි නේ බඩගිනි ඇතිනේ කමක් නෑ තල කැවට මට මහලොකු පාඩුවක් වෙන්නේ නැනේ" යි සිතුවා.

පසුදිනයේත් දිය නෑමට යන අතර මේ පුංචි කුමාරයා මහළු කාන්තාවගේ තල අරගෙන කෑවා.

තෙවන දිනයේ ත් මේ ලෙසටම සිදු වුවා.

මහළු කාන්තාව දිසාපාමොක් ආචාරීන් හමු වී මෙම සිද්ධිය කියා සිටියා.

තල කෑ වරදට දිසාපාමොක් ආචාරීන් කුමරුට උණ පතුරකින් පහර දී දඬුවම් කළා.

කුමරුට මේ සිදු වීම නිසා දිස්පාමොක් ආචාරීන් වෙත වෛරී සිතක් ඇති කර ගෙන රජකම ලැබුණු පසු දිසාපාමොක් ආචාරීන් මැරවීමට ආමාත්‍ය වරුන්ට පැවසුවා.

දිස්පාමොක් ආචාරීන් ශිල්ප උගන්වපු නිසා ඔබ රජකමට පත් වු බව බවසා ඇදුරුතුමන්ගේ වටිනාකම රජුට වටහා දුන්නා.
තමා සිදු කරන්න ගිය වරදෙහි බරපතලකම රජු විසින් තේරුම් ගත්තා.

**සොරකම පුංචි වුවත් එය විශාල වරදකිග**

කෙළියට කඩක් සඟවා යහළුවකු ගෙනේ
එළිකොට නැවත දුන් මිනිසෙකුට එතෙකිනේ
විළි වැස්මක් නොලැබුණි දෙව් වුණත් අනේ
කෙළියටවත් නොකරව් සොරකමක් දැනේ

*සෙල්ලමට යහළුවෙකුගේ රෙද්දක් සඟවා නැවත ආපසු දුන් මිනිසෙකුට එම පාපය නිසා දෙවියකු වී උපන් අවස්ථාවේ විළි වැස්මක් නොලැබුනෝය. ඒ නිසා සෙල්ලමකටවත් සොරකමක් කළහොත් එහි විපාක ලැබෙන්නේය.*

ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රී හිමි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



# 12 පාඩම - නිති පන්සිල් පොහොය අටසිල්

**සීලය (සීලය යනු කය වචන සංවර ගැනීමයි.)**

චාරිත්‍ර ශීලය
(කළ යුතු දේවල් කිරීම)

වාරිත්‍ර ශීලය
(නොකළ යුතු දේවල් වලින් වැළකීම)

## ගිහි අය රැකිය යුතු ශීලය පන්සිල් (නිත්‍ය ශීලය)

(01) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(ප්‍රාණීන් නැසීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(02) අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(නොදුන් දෙයක් සොර සිතින් නොගැනීමේ සිල්පදය සමාදන් වෙමි.)

(03) කාමේසු මිච්ඡාචාර වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(මම කාමයෙහි වරදවා හැසිරීමෙහි වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.)

(04) මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම බොරු කීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.)

(05) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.)

(මම මදයට හා පමාවට හේතුවන මත්වතුර හා මත්ද්‍රව්‍ය භාවිතය වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

### සිල් රැකීමෙන් ලැබෙන ප්‍රතිලාභ

- සිත පිරිසිදු වේ.
- නීරෝගී වේ.
- මිතුරන් වැඩිවේ.
- බොහෝ දෙනාගේ ආදරයට ගෞරවයට ලක්වේ.
- කීර්තිය ඇති වේ.
- අන් අයගේ විශ්වාසය දිනාගත හැකිවේ.
- ඕනෑම පිරිසක් අතරට යාමට ආත්ම ශක්තිය ලැබේ.

## උපෝසථ ශීලය (අටසිල්)

(01) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(ප්‍රාණීන් නැසීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(02) අදින්නාදාන වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(නොදුන් දෙයක් සොර සිතින් නොගැනීමේ සිල්පදය සමාදන් වෙමි.)

(03) අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම උතුම් නොවන හැසිරීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(04) මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම බොරු කීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.)

(05) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(මම මදයට හා පමාවට හේතුවන මත්වතුර හා මත්ද්‍රව්‍ය භාවිතය වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.

(06) විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(මම නොකල්හි ආහාර ගැනීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(07) නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.)


මම නැටුම් , ගැයුම් , වැයුම් කෝලන් ආදියට සහභාගී වීමෙන් ද මල් , ගඳ විලවුන් ආදිය දැරීමෙන් හා සැරසීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි)

(08) උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම උස් අසුන් හා මහ අසුන් වලින් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 13 පාඩම - උපුල්වන් යැයි පතළ තෙරණිය




- සැවැත්නුවර සිටු කුලයක **උපුල්වන් පැහැ ශරීරක් ඇති** රූමත් තරුණියක් සිටියා.
- ඇය නමින් **උප්පලවණ්ණා** නම් වුණා.
- එක්තරා ආත්මභාවයක **පදුමුත්තර බුදුන් දවස උපුල් මල් පූජා කර** තමුන්ටත් උපුල්මල් වන් රූප ශ්‍රීයක් ලැබෙන්න යැයි ප්‍රාර්ථනා කිරීම නිසා මෙසේ උප්පලවණ්නා තරුණිය උපුල්වන් පැහැ වූ බව පැවසෙයි.
- නිසි වයසට පැමිණීමෙන් පසු මව්පියන් කැමති ලෙස ඇයගේ විවාහය යෝජනා වුණා.
- තමන් ගිහිගෙය විසීමට අකමැති බව පවසා දෙමව්පියන්ගෙන් පැවදි වීමට අවසර ඉල්ලා සිටියා.
- දෙම්පිය අවසරය අරන් උප්පලවණ්නා තරුණිය මහණ වීම සඳහා ආරාමයට පිටත් වුණා.
- මහණදම් පුරමින් එතුමිය මාර්ගඵල ලබාගත්තා.
- **සෘද්මත් භික්ෂුනීන්** අතර අගතනතුර උප්පලවණ්ණා තෙරණියට හිමි වුණා.

මලක් පූජා කිරීම විශාල පිංකමක් නොවුණත් හිතේ සතුටින් කළ ඒ පුංචි පිංකම නිසා උප්පලවණ්ණාට විශාල ආනිසංසයක් ලැබුණි. **එනිසා කුඩා යැයි නොතකා සෑම විටම පිංකම් කරමු.**

පුඤ්ඤඤ්චේ පුරිසෝ කයිරා - කයිරාථේනං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ - සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ

***පුද්ගලයා පින් කරන්නේ නම් එක් වරක් පිනක් කොට මම පිනක් කළෙමි දැන් ඉතින් මේ ප්‍රමාණවත්ය කියා එතැන් පටන් එහි නොඇලී නොසිට යළි යළිත් පින් කළ යුතු වේ. පින් රැස් කිරීම , එහි වර්ධනය මෙලෝ පරලෝ සැප ගෙන දෙන බැවින් සැපයක්ම වන හෙයිනි.***

(බුදුරදුන් දෙව්රම වැඩ වසන සමයේ ලාජ දෙව්දුව අරඹයා දේශනා කර ලදී.)

හේතු වූ කතාව

මහාකාශ්‍යප තෙරණුවෝ පිප්ඵලී ගුහාවෙහි වැඩවාසය කනර කාලයෙහි ධ්‍යානයට සමවැදී සත්වෙනි දින එයින් නැගිට පිඬු පිණිස හැසිරීමට සුදුසු තැනක් දිවසින් බලන කළ එක්තරා මහළු කතක් බොහෝ වෙහෙස වී හැල් වීකරල් ගෙනවුත් විලඳ කරන බව දුටුවා.

ඇගේ සැදැවත් බව දැනගත් මහාකාශ්‍යප තෙරණුවෝ ඇගේ නිවස ඉදිරිපිට වැඩ සිටියා.

ගෙට ගිය ඇය ඉක්මනින් විලඳ ගෙනවිත් මහාකාශ්‍යප මහතෙරණුවන්ට පූජා කළා.

පසුව එදිනම ඇය සර්පයෙකු දෂ්ට කිරීමෙන් මිය ගියා.

පැහැදුණු සිතින් සහ මහාකාශ්‍යප තෙරුන්ට විලඳ පූජා කළ පිනෙන් ඇය තව්තිසා දෙව්ලොව දෙව්දුවක ලෙස උපත ලැබුවා.

තමාට මෙවන් සැපක් අත් වුයේ ඇයිදැයි ඇය විමසිලිමත් වන විට තමන් කළ විලඳ පූජාව නිසා මෙවන් සැපයක් ලද බව දැනගත්තා.

මෙවන් පිනක් අත් කර දුන් තෙරණුවන්ට උවටැන් කරමියි සිතා ඇය වහා ගොස් තෙරණුවන් වැඩ වසන කුටිය සහ ඒ අවට පිරිසිදු කිරීම් කළා.

මෙයට අකමැති වූ කාශ්‍යප තෙරුණ් ඇයට පිටව යන ලෙස දන්වා සිටියා.

මෙයින් ශෝකයට පත් දෙව් දුව හඬන හඬ ඇසී බුදුරසදුන් විසින් මෙම ගාථාව දේශනා කළ සේක.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 14 පාඩම - මෙත් සිත පතුරවමු.

➤ 7 පාඩමේ දී භාවනා ඉරියව් සම්බන්ධව දක්වා ඇත.

## මෛත්‍රී භාවනාව

### පළමු පියවර

මම වෛර නැත්තෙක් වෙම්වා!

මම තරහා නැත්තෙක් වෙම්වා!

මම දුක් පීඩා නැත්තෙක් වෙම්වා!

මම බිය උවදුරු නැත්තෙක් වෙම්වා!

මම සුවපත් වෙම්වා!

මා මෙන් ම , මාගේ ගුරු දෙගුරු උතුමෝ ද

වෛර නැත්තෝ වෙත්වා!

තරහ නැත්තෝ වෙත්වා!

දුක් පීඩා නැත්තෝ වෙත්වා!

බිය උවදුරු නැත්තෝ වෙත්වා!

### දෙවන පියවර

වචනයෙන් කියවන ලද වගන්ති ප්‍රකාශ නොකොට ටික වේලාවක් එකින් එක සිතන්න.

මෙත්තා විහාරි යෝ භික්ඛු පසන්නෝ බුද්ධ සාසනේ
අධිගච්ඡේ පදං සන්තං සංඛාරූපසමං සුඛං

*මෛත්‍රී විහරණයෙන් යුතු යම් භික්ෂුවක් බුදු සසුනෙහි පැහැදුනේ නම් , උන් වහන්සේ සංස්කාර දුරු කොට නිවන කරා ගමන් කරයි.*

- සුවසේ නින්ද යාම
- සුවසේ අවදිවීම
- නරක සිහින නොදැකීම
- මිනිසුනට ප්‍රිය වීම
- නොමිනිසුනට ද ප්‍රිය වීම
- දෙවියන්ගේ රැකවරණය ලැබීම
- ගින්න ජලය ආදියෙන් විපතක් නොවීම
- සිත සමාධිගත වෙයි
- මුහුණ පැහැපත් වෙයිග
- මුළා නොවී කළුරිය කරයි
- රහත් බව නොලදහොත් බඹ ලොව උපදී

මෙත්තානිසංස සූත්‍රයේ පරිදි මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ප්‍රතිලාභ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 15 පාඩම - අපේ කටයුතු අපිම කරගමු.

එදිනෙදා ජීවිතයේ දී ඔබ විසින් පාසලේ දී හා දහම් පාසලේදී සිසිවෙකු සිසුවියක ලෙස ද නිවසේ දී දරුවෙකු ලෙස ද ඔබේ කටයුතු ඉටු කර ගැනීමට සිදු වනවා.

ඔබේ කටයුතු ඔබ විසින් ඉටු කිරීම බොදු දරුවෙකු සතු යහපත් ලක්ෂණයක්.







ඔබට කර ගත හැකි ඔබේ කටයුතු

- ආහාර ගැනීමෙන් පසු භාජන සේ දීම
- ඇඳුම් සෝදා ගැනීම.
- පොත්වලට කවර දැමීම
- නිවස පිරිසිදු කිරීම
- මිදුල අතුගෑම

අන් අය ගැන බලාපොරොත්තු තබා ගැනීමෙන් නිසි කලට කාර්යයන් ඉටු නොවීම නිසා ඔබට පාඩු සිදුවිය හැක.

නපරේසං විලෝමානි න පරේසං කතාකතං
උත්තනෝව අවෙක්ඛෙය්‍ය කතානි අකතානිච

***අනුන් කරන්නා වූ හොඳ නරක ගැන නොසිතා තමා කළ හොඳ නරක ගැන සිතන්න.***

හේතු වූ කතාව

බුදුරදුන් සැවැත් නුවර වැඩ වාසය කරන සමයෙහි එක්තරා කාන්තාවන් පාඨික නම් තරුණයෙකු තම පුතු තනතුරේ තබමින් පෝෂණය කළා.

බුදුරදුන්ගෙන් බණ අසා පැමිණ අසල්වැසි නිවෙස්වල අය ගුණ වර්ණනා කරන නිසා අර කාන්තාවටත් බුදුරදුන් නිවසට වැඩම කර දන් පිළිගැන්වීමට සිතුනා.

පාඨික හා මේ පිළිබඳව පැවසුවත් බුදුරදුන්ගෙන් බණ ඇසීමට පාඨික බොහෝ අකමැති වුණා.

නමුත් දින ගණනාවක් වූ මවගේ ඇවටිල්ල නිසා පාඨික අවසානයේ බුදුරදුන්ට දනට වැඩම කරවීමට යැයි ආරාධනා කළත් නිවසට එන මාර්ගය කොලෙසදැයි පැවසුවේ නැහැ.

නමුත් බුදුරදුන් පාඨිකගේ නිවසට දනට වැඩම කළා. දානය අවසානයේ පින් අනුමෝදං කිරීමේ දී පාඨිකගේ මව මහ හඬින් සාදුකාර දීම නිසා කිපුණු පාඨික තරහෙන් බැණ වදිමින් නිවසිනි පිටව ගියා.

මෙයින් මහත් අපහසුතාවයට පත් කාන්තාව මේ ගැන සිතමින් සිතින් පීඩා වින්දා.

එම කාන්තාව අරඹයා බුදු රදුන් මෙම ගාථාව දේශනා කළා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 16 පාඩම - සුභාෂිත වැකි

**සුභාෂිතය-** උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථයකි.

**සීතාවක රාජධානී සමයේ අලගියවන්න මුකවෙටිතුමා විසින් රචනා කර ඇත.**

**විපුල ගුණැති මහතුන් හට පත් විපත**
**නිසල නැණින් යුතු උතුමෝම දුර ලත**
**කලල ගිලුණු මත වරනිඳු ගොඩ ගනුත**
**තුමුල බලැති ගිජිඳකු මිස අන් කෙවත**

**මහත් වූ ගුණයෙන් යුතු උතුමන්ට විපතක් පැමිණි විට එය දුරු කළ හැකි වන්නේ එවැනිම තැන්පත් උතුමන්ට පමණි.** ඒ කෙසේ දැයි කිවහොත් මහබල ඇති ඇත් රජෙකු මඩෙහි එරුණු විට ඔහු ගොඩ ගත හැකි වන්නේ එවැනිම මහ බල ඇති ඇත් රජෙකුට පමණක් වන්නාක් මෙනි.

**නපුරු කලට සතහට පැමිණෙයි වෙහෙස**
**එදුරු නොවෙයි කළ පව් පල දෙවා මිස**
**තඹුරු වනය මුකුලිත වන බව සවස**
**කවුරු විසින් වැළකිය හැකි මෙදිය කුස**

සවසට නෙළුම් මල් පරවී යාම කිසිවෙකුටවත් වළකාලිය නොහැකිය. එමෙන්ම **නරක කාලයට සත්වයාට දුක් කරදර පැමිණි විට කරන පව් වලට විපාක ලබා දී පිණිස එයින් මිදී සිටීමට නොහැකිය.**

**රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වන තුරු**
**මිතුරු වේය දිගතින් හමන මඳ මරු**
**මිතුරු නැසීමට එම වෙයි පස මිතුරු**
**මිතුර නෑ කෙනෙක් නිවතුන් හට කවුරු**

වනයේ මහ ගින්නක් හටගත් විට ඒ ගින්න පැතිරී යාමට සුළඟ මිතුරු වෙයි. මේ සුළඟම පහන් දැල්ල නිවීමේ දී සතුරකු ලෙස ක්‍රියා කරයි. එමෙන් **දුප්පතුන්ට මිතුරු වන හෝ නෑදෑ වන හෝ කෙනෙක් සිටිත් ද ? නැත්තාහුය.**

**කුරිරු ගොර සපුන්ගේ දළ ගෙහි විසය**
**මදුරු මැසි කැලැන්ගේ තුඩගෙහි විසය**
**රුදුරු නුහුසුවන්ගේ වලගෙහි විසය**
**නපුරු දුදනන්ගේ සියලඟෙම විසය**

නපුරු සර්පයන්ගේ කෙළවර විෂ රැඳේ. මැසි මදුරුවන්ගේ විෂ ඇත්තේ තුඩ කෙළවරේ පමණි. නපුරු ගෝනුස්සන්ගේ වලිගය අග විෂ පවතී. එහෙත් **නරක මිනිසුන්ගේ සිරුර පුරාම විෂය.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 17 පාඩම - පිරිසිදුකමින් දිවි සරසමු

කුඩා අවධියේ සිටම නීරෝගීව සිටීමට අප හුරුපුරුදු වෙන්න ඕනේ.

ඒ සඳහා එක් අංගයන් වන නිවස , වටපිටාව හා පරිහරණය කරන දෑ පිරිසිදුව තබා ගත යුතු වනවා.

## නිවස පිරිසිදුව තබා ගැනීමට කළ හැකි දේ

- නිවස අතුගෑම.
- බඩු මුට්ටු පිස දැමීම.
- ඇඳ ඇතිරිලි පිළිවෙලට සැකසීම.
- පොත් පත් , ඇඳුම් පැළඳුම් , පාවන් ආදිය නියමිත තැන තැබීම.
- ඉවත දමන කුණු නිසි පරිදි ඉවත් කිරීම.



ගේ දොර පිරිසිදුව පැවතීමෙන් ලැබෙන වාසි

- හිතේ පිරිසිදු කමක් ඇති වීම.
- සිත සතුටු වීම.
- ලෙඩ රෝග අඩු වීම.
- සැමට ප්‍රිය ස්ථානයක් බවට පත් වීම.

## පිරිසුදුව පිළිවෙලට ඉන්න අපි පුරුදු වෙන්න ඕනේ හොඳ පුරුදු













ස්වාමීන් වහන්සේලා පිරිදුව පිළිවෙලට වෙසීමට දිනපතා සිදු කරන ක්‍රියාවන් වලට වතාවත් කියලා කියනවා.

- ආචාර්ය වත
- දානශාලා වත
- ආගන්තුක වත
- වැසිකිළි වත



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 18 පාඩම - විවේකය ඵලදායී කර ගනිමු

## විවේකය කියවීම සඳහා යොදා ගැනීම

- කියවීමෙන් නොදන්නා බොහෝ දේ දැනගැනීම
- අපි දන්නා දේ යළි මතකයට නගා ගැනීම
- වැරදි දැනුම නිවැරදි කර ගැනීම
- කියවීම විනෝදයක් කර ගැනීම

- පාසල් පුස්තකාලයෙන්
- දහම් පාසල් පුස්තකාලයෙන්
- පොදු මහජන පුස්තකාලවලින්
- යහළුවන්ගෙන්
- මිලදී ගැනීමෙන්




ළමයින්ට ගැළපෙන පොතක් තෝරා ගන්න ඕනේ.

දැනුමක් ඇති වැඩිහිටියෙකුගෙන් ඊට උදව් ගන්න පුළුවන්.

**උපන් දිනයට හෝ වෙනත් විශේෂ දිනවල පොතක් මිලදී ගැනීමට හුරු වන්න.**

- කාලය අපතේ නොයෑම
- එකට එක්ව වැඩ කිරීමට හුරු වීම
- දැනුම වැඩි කර ගත හැකි වීම
- සතුටක් හා විනෝදයක් ලැබීම
- නිර්මාණාත්මක හැකියාව වැඩි වීම
- අනෙක් අයට දැනුම බෙදා දී සතුටු වීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රමදාන හා සුභ සාධන කටයුතුවලට යොදා ගැනීම

**කළ හැකි වැඩ**

- විහාරස්ථානය හා අවට පිරිසුදු කිරීම
- විහාරස්ථානයට එන මාර්ගය පිරිසුදු කිරීම
- විහාර භූමියේ මල් හා ප්‍රයෝජනවත් පැළ සිටුවීම
- පින්තාලි තැබීම

**ශ්‍රමදාන**

- එකට එක්ව වැඩ කිරීමට හුරු වීම
- වැඩ සැලසුම් කිරීම
- අපෙන් අනෙක් අයටත් සේවයක් සිදු වීම



**ප්‍රයෝජන**

- විවේක කාලය ප්‍රයෝජන ලෙස ගත කිරීම
- එක්ව වැඩ කිරීමට හුරු වීම
- අනෙක් අයට උදව් කිරීමෙන් සතුටු වීම
- පින් සිදු කර ගැනීමට හැකි වීම

උපදින හැම මල් පල  
නොබුදින ගස කිසි කල  
අනුනට දී හැම කල  
තුටුවෙයි පුදුමෙකි බල

ඉඩක් ලැබෙන හැම විට  
වැඩක් කළොත් ලෝකෙට  
නමක් රැඳියි හැම විට  
ඔබත් වටී ලෝකේට

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



# 19 පාඩම බුදු ගුණ සිහි කරමු



## 1 පියවර

මුව දොවා දැත් පිරිසිදු කොට පිරිසිදු ඇඳුමින් සැරසෙන්න.

## 2 පියවර

බුද්ධ ප්‍රතිමාවක් අභියස මල් පහන් පුදා දොහොත් මුදුන් දී පංචශීලය සමාදන් වී බුද්ධ වන්දනාවේ යෙදෙන්න.

## 3 පියවර

පහසු ඉරියව්වකින් කය ඍජුව තබාගෙන වම් අත්ල උඩින් දකුණු අත්ල තබාගන්න.

**මෙම ශ්‍රේණියේ දී නව අරහාදී බුදු ගුණ වලින් එක් ගුණයක් පිළිබඳව අවධානය යොමු කරමු.**

## අරහං බුදු ගුණය

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ **සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින්** අරහං නම් වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ **සියලු පාපයන්ගෙන් මිදුණු බැවින්** අරහං නම් වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ **සියලු ලෝවැස්සන්ගේ ආමිස ප්‍රතිපත්ති පූජා ලැබීමට සුදුසු වන බැවින්** අරහං නම් වන සේක.

ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

**මා කළ මේ පින්කමින් මට නිවන් දකින තුරුම නරක මිතුරන්ගේ ඇසුරක් නොවේවා. ගුණවත් යහපත් මිතුරන්ගේ ඇසුරක්ම ලැබේවා.**

බුද්ධෝපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පම්පි චේ අඤ්ඤමභාසමානෝ
ඛියේථ කප්පෝ චිරදීඝමන්තරේ
වණ්ණෝ න ඛියේථ තථාගතස්ස

**බුදුවරයකුගේ ගුණ මුවකින් ම කල්පයක් තිස්සේ වර්ණනා කළ ද දීර්ඝ වූ කල්පය ගෙවී යයි. එහෙත් බුදුගුණ නම් අවසන් නොවේ.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



# 20 පාඩම වෙසක් උත්සවය

## වෙසක් උත්සවයේ වැදගත්මක



- බුදුන් වහන්සේගේ ඉපදීම , බුදුවීම හා පිරිනිවන්පෑම යන තෙමඟුල සිදු වීම.
- සම්බුද්ධත්වයෙන් දස මසකට පසු කිඹුල්වත් නුවරට වැඩම කර ඥාතීන්ගේ මානය දුරු කර යමාමහපෙළහර පෑම.
- බුද්ධත්වයට පත් වී වසර අටකට පසුව ලක්දිවට පැමිණි උන්වහන්සේ සුමන සමන් දෙවියන්ගේ ආරාධනයෙන් සමනල කන්දේ සිරිපා සටහන පිහිටුවීම.
- දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් අප මහා බෝසතාණන් වහන්සේ සුමේධව ඉපිද නියත විවරණ ලැබීම.
- බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායක ආනන්ද හිමි පිරිනිවන් පෑම.

## වෙසක් දින ලක්දිව සිදු වූ වැදගත් සිදුවීම්



- ලක්දිව පළමු රජතුමා වන විජය කුමරුගේ ලංකාගමනය
- දේවානම්පියතිස්ස රජුගේ දෙවන රාජාභිෂේකය පැවැත්වීම.
- දුටුගැමුණු රජතුමා රුවන්වැලි සෑයේ වැඩ ආරම්භ කිරීම.
- අනුරාධපුර මහා විහාරයේ උපසම්පදා උත්සවය ආරම්භ වීම.

## වෙසක් පොහෝ දින අපි මොනවද කරන්නේ .........



- සිල් සමාදන් වෙනවා
- විහාරස්ථාන කරා ගමන් කරනවා
- මල් පූජා කරමින් පහන් දල්වමින් තෙරුවන් ගුණ සිහි කරනවා
- විශේෂ ධර්ම දේශනාවලට සවන් දෙනවා
- භාවනා කරනවා
- දන්සැල් සංවිධානය කරනවා
- වෙසක් කූඩු හදනවා
- වෙසක් තොරණ බඳිනවා
- වෙසක් සැරසිලි වලින් නිවස හැඩ කරනවා
- වෙසක් බැති ගී පවත්වනවා

Sri Lanka's Largest Past Paper Bank - iskolee.com

# 21 පාඩම - ධම්මපදයෙන් බිඳක්

අප්පමාදෝ අමත පදං    පමාදෝ මච්චුනෝ පදං
අප්පමත්තා න මීයන්ති    යේ පමත්තා යථා මතා

**පමා නොවීම නිවනට මඟයි. පමා වීම මරනයට මඟයි,පමා නොවූවෝ නොමියෙති. පමා වූ අය මියැදුණු අය මෙනි.**

**ගාථාව දේශනා කීමට හේතු වූ කතාව**

*මාගන්ධිය නැමැති ස්ත්‍රීන් 500 ක් හා ඇයගේ නෑදෑයින්ගේ ද මරණය අරබයා*

අතීත දඹදිව කොසැඹෑ නුවර කොසොල් රජුට මාගන්ධියා හා සාමා නම් බිසවුන් දෙදෙනෙක් සිටියා.

සාමා බිසව බොහොම දැහැමි මෛත්‍රී සහගත තැනැත්තියක්.

මේ නිසාම රජු ඇයට බොහෝ ඇළුම් කළා.

මාගන්ධියා බිසව ඊට ඊර්ෂ්‍යාවෙන් පසුවුණා. දිනක් රජුට මුසා පවසා ඇය මැරවීමට තැත් කළත් එය ද අසාර්ථක වුණා.

පසුව රජු මාළිගයේ නොසිටි මොහොතක ඇයගේ සේවිකාවන් ද සමඟ ඇය විසූ මාළිගය මාගන්ධියා බිසව විසින් ගිනි තැබුවා.

මේ බව දැනගත් රජු මාගන්ධියා ඇතුළු ඥාතීන්ද ගිනි තබා මරණයට පත් කරවූවා.

න භජේ පාපකේ මිත්තේ    න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ    භජේථ පුරිසුත්තමේ

**පව්කම් කරන මිතුරන් ද , සැහැසිකම් කරන අයද ඇසුරු නොකළ යුතුය. කල්‍යාණ මිත්‍රයන් හා උසස් පුද්ගලයන් ඇසුරු කළ යුතුය.**

**ගාථාව දේශනා කීමට හේතු වූ කතාව**

*ඡන්න තෙරුන් අරබයා*

බුදුන් වහන්සේට කිට්ටුවෙන් සිටිය යුතු තමා මිස අගසව් දෙනම වන සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා නොවන බව පවසමින් යන යන තැන අගසව්දෙනමට පරිභව කරන්නට චන්න තෙරුන් පුරුදුව සිටියා.

මෙය බුදුරදුන්ට ආරංචි වී **අගසව් දෙනම ඔබේ කලයාන මිතුරෝය** යැයි පවසමින් ඡන්න තෙරුන්ට මේ ගාථාව දේශනා කළා.

සබ්බ පාපස්ස අකරණං    කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං    ඒතං බුද්ධානසාසනං

**සියලු පව් නොකිරීමත් කුසල් උපදවා ගැනීමත් සිත දියුණු කර ගැනීමත් බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාවයි.**

ආන්නද හිමියන් අරබයා

ආනන්ද හිමියන් විමසූ පැනයට පිළිතුරක් ලෙස



ධම්මපදය යනු **බුදුරජාණන් වහන්සේ විසින් විවිධ අවස්ථාවලදී දේශනා කොට වදාළ ගථාවන්ගේ සංග්‍රහයකි.**

ථෙරවාද ත්‍රිපිටකයෙහි **ඛුද්දක නිකායට** අයත් වන ධම්මපදය පෙළ දහමේ ජනප්‍රියතම ග්‍රන්ථයයි.

**භාෂා ගණනාවකට පරිවර්තය** වී ඇති ධර්ම ග්‍රන්ථයකි.

මෙහි පරිච්ඡේද 26 ක ගාථා **423 ක්** අන්තර්ගතය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 22 පාඩම - පස් පව්

පන්සිල් යනු කයින් සහ වචනයෙන් සිදු වන මෙම දුශ්චරිත පසෙන් වැළකීමයි.

පන්සිල් රකින්නාට වෙන වෙනම ලැබෙව අනිසංස මෙසේය.

❖ පරපණ නැසීමෙන් වැළකීම (පාණාතිපාතා වේරමණී ..........)

- කාටත් ප්‍රිය මනාප පුද්ගලයකු වේ.
- පර උපක්‍රමවලින් මරණයට පත් නොවේ.
- ප්‍රියන්ගෙන් වෙන් වන්නට සිදු නොවේ.
- දීර්ඝායුෂ ලැබේ.
- මනාව පිහිටි අඟපසඟක් ඇත්තෙකු වේ.

❖ අදත්තාදානයෙන් වැළකීම (අදින්නාදානා වේරමණී .......)

- මහ ධනවතකු වේ.
- නූපන් වස්තු උපදවීමට පුණ්‍ය ශක්තිය ලැබේ.
- කැමති වස්තූන් වහා ලබන්නෙකු වේ.
- ලෝකයේ උත්තමයකු බවට පත් වේ.
- සැප විහරණ ඇත්තෙකු වේ.

❖ කාමයෙහි වරදවා නොහැසිරීම (කාමේසු මිච්ඡාචාරා වේරමණී ........)

- සතුරන් නැත්තෙකු වේ.
- අහාරපානාදිය අඩුවක් නැතිව ලැබේ.
- ඔවුනොවුන්ට ප්‍රිය අඹුසැමියන් ලැබේ.
- සැපසේ නින්ද යාම
- සැපසේ පිබිදීම

❖ මුසා බස් නොපැවසීම (මුසාවාදා වේරමණී ......)

- අතිශය ප්‍රසන්න ඉඳුරන් ඇත්තෙකු වේ.
- සමානව පිහිටි සුදු දත් දෙපළක් ඇත්තෙකු වේ.
- අශෝභන වූ සිරුරක් නැත්තෙකු වේ.
- නෙළුම් පෙත්තක් වැනි මෘදු දිවක් ලබන්නෙකු වේ.
- මිහිරි කටහඬක් ඇත්තෙකු වේ.

❖ මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකීම (සුරාමේරය මජ්ජපමා ......)

- සෑම විටම එළඹී සිහියෙන් සිටින අයෙකු වේ.
- අලස නොවේ
- ඥානවන්ත අයෙකු වේ.
- පව් කිරීමට ලජ්ජා ඇති ගුණවත් අයෙකු වේ.
- ඍජු අදහස් ඇත්තෙකු වේ.

න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ

න පබ්බතානං විවරං පවිස්ස

න විජ්ජති සො ජගතිප්පදෙසෝ

යත්ථට්ඨිතෝ මුඤ්චෙය්‍ය පාපකම්මා

**අහසෙහි ද , මුහුද මැදද , කඳු කුහරයක ද සැඟවී සිටියත් කළ පාපයෙන් මිදිය නොහැකිය.**

**ගාථාව දේශනා කිරීමට හේතු වූ කතාව**

"මගේ දුව හැර දමා ගියා , මා පුතු ද පැවිදි කරවා සතුරු කම් කළා"

යැයි සුප්‍රබුද්ධ රජතුමා බුදුරජාණන් වහන්සේ සමඟ වෛරයෙන් පසු විය.

දිනක් බුදුන් දනට වඩින මඟට ගොස් රා බී එතුමා එන මග වසා දැමීමට සුප්‍රබුද්ධ රජතුමා ක්‍රියා කළා.

අසළ ගම් වාසීහු මේ දැක මඳක් නැවතී පසුව වඩින ලෙස දන්වා සිටියා. මෙහිදී බුදුරදුන් සිනහ පහළ කළා.

ඒ ඇයිදැයි ආනන්ද හාමුදුරුවන් ඇසූ විට

"මේ කරන පවින් සුප්‍රබුද්ධ තෙම හෙතෙමගේ නිවසේ පාතමාළයේ පඩි පැලී නිරයට වදින්නේ ය" යැයි පවසා මෙම ගාථාව දේශනා කළා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


# 23 පාඩම - ශාසනික ව්‍යවහාර

ස්වාමීන් වහන්සේලා සමග කතා කරන විටත් , පන්සලේදී හා ආගමික කටයුතු වලදීත් යොදන විශේෂ වචන ශාසනික ව්‍යවහාරයි.

| සාමාන්‍ය ව්‍යවහාරය | ශාසනික ව්‍යවහාරය |
|---|---|
| කනව / බොනව | වළඳනවා |
| නිදාගන්නවා | සැතපෙනවා |
| යනවා /එනවා | වඩිනවා |
| අතුගානවා | අමදිනවා |
| වාඩි වෙනවා | වැඩ ඉන්නවා |
| සිවුර අදිනවා | සිවුර පොරවනවා |
| ඔයා/ඔහේ | ඔබ වහන්සේ |
| ඔව් | එහෙයි /එහෙමයි |
| තේ | ගිලන්පස |
| බුලත් විට | දැහැත් විට |
| වතුර | පැන් |
| දන් වළඳන තැන | දාන ශාලාව |
| අතුරු පස | අවුල්පත් |
| රෙද්ද | පිරුවටය |
| කුස්සිය | දං ගෙය |
| උදේ ආහාරය | හීල් දානය |
| මිදුල | මළුව |
| මාර්ගය | මංපෙත් |
| පාඩම් කරනවා | වනපොත් කරනවා |
| මල් කඩනවා | මල් නෙළනවා |
| භාවනා කරන තැන | භාවනා කුටිය |
| සක්මන් කරන තැන | සක්මන් මළුව |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 24 පාඩම - පොසොන් උත්සවය




"මහින්දාගමනය සැලකිය යුත්තේ සිංහල සභ්‍යත්වයේ ප්‍රභවය ලෙයසි. උන්වහන්සේ ලංකාවට ගෙන ආවේ හුදෙක් අභිනව ආගමක් පමණක් නොවේ. අධ්‍යාපනය , සාහිත්‍ය, ගෘහ නිර්මාණ , කාෂිකර්මාන්තය පමණක් නොව සාරධර්මයන්ගෙන් සපිරුණු පැවැත්ම ආදී සෑම අංශයකම ගුණාත්මක අභිවෘද්ධියක් ඇති කිරීමට මිහිඳු හිමියන්ට හැකි වුණා."

- ලංකාවේ ප්‍රථම මහණ උපසම්පදාව සිදු වීම ද පොසොන් පොහෝ දින සිදු වුණා.
- බුද්ධ චරිතය දෙස බලන කල්හි


බුදුන් වහන්සේ බුදු වී සිව්වන සතියේ රුවන්ගෙයි වැඩ සිටිමින් ධර්මය මෙනෙහි කළා. එහිදී සවණක් ගණ බුදුරැස් මාලාවෝ බුද්ධ ශරීරයෙන් විහිදුනේ පොසොන් පොහොය දිනකයි.

## පොසොන් පොහෝ දින අපි මොනවද කරන්නේ .........

- ❖ සිල් සමාදන් වෙනවා
- ❖ විහාරස්ථාන කරා ගමන් කරනවා
- ❖ මල් පූජා කරමින් පහන් දල්වමින් තෙරුවන් ගුණ සිහි කරනවා
- ❖ විශේෂ ධර්ම දේශනාවලට සවන් දෙනවා
- ❖ භාවනා කරනවා
- ❖ දන්සැල් සංවිධානය කරනවා
- ❖ පොසොන් කූඩු හදනවා
- ❖ පොසොන් තොරණ බදිනවා
- ❖ පොසොන් සැරසිලි වලින් නිවස හැඩ කරනවා
- ❖ පොසොන් බැති ගී පවත්වනවා









Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 25 පාඩම - වන්දනා ගාථා හා වන්දනා කවි

## පැන් පූජාව

පසන්නං සීතලං සුද්ධං
පානීයං මධුරං පියං
පූජේමි ලෝකනාථස්ස
අරහන්තස්ස තාදිනෝ

සුසීතල පිවිතුරු
මේ පැන් මියුරු පියකරු
හැම පුදට නිසිවන
තිලෝනා මුනි සඳුට පුදනෙමි

## ආහාර පූජාව

ඕජවන්තං රසවන්තං
පණීතං භෝජනං ඉමං
පූජේමි ලෝකනාථස්ස
අරහන්තස්ස තාදිනෝ

රස ගුණෝපේත
මේ භෝජන පණීත
හිස තබා දෝත
හිමිට පුදනෙමි ලෝකනාථ

## දැහැත් පූජාව

නාගවල්ලී දලූපේතං
චුණ්ණපූග සමායුතං
පූජේමි ලෝකනාථස්ස
තම්බූලං මධුරං පියං

සුවඳ රස බුලතට
සුණු සහ පුවක් මුසුකොට
සැදූ මේ දැහැත් විට
පුදමි තුන්ලෝ තිලක මුනිඳුට

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මා වැනි දියණියක හදා වඩා පෝෂණය කළ ආදරණීය දෙමව්පියන්ටත් මෙය සකස් කිරීමට අවශ්‍ය කාලය ලබා ගැනීමේ දී සහය වූ මා ආරණීය සැමියාටත් , පොත පත සපයා දෙමින් උපකාර කළ ලුණුගම සිරිපැරකුම්බා දහම්පාසලේ වර්තමාන ප්‍රධානාචාර්ය දිනේෂ් උදයංග විමලධර්ම මහතාටත් , ශක්තියක් වෙමින් මා අසලින් රැදී සිටින මා ආදරණීය කල්‍යාණ මිතුර මිතුරියන්ටත් සෙනෙහසින් මා හද පිරි කෘතගුණය මෙලෙස පුද කරමි.

# ස්තූතියි …………